හිම බිමේ සුදු රෝස

විද්‍යානි මනතුංග ලියන නවකතාව

අවසාන කොටස

මම බොහෝ සෙයින් හුදකලා වූ ජීවිතයකට හුරු-වෙමින් සිටියෙමි. එහෙත් ජීවිතය පිළිබඳව සියලු බලාපොරොත්තු ම තුළ නොසිඳී පැවතිනි. බලාපොරොත්තු යනුවෙන් මා දුටුවේ මගේ හිනඩ සිත තුළ පමණක් රැඳෙනු, එහෙත් ලෝකයට කිසි-සේත්ම රහසක් නොවේයැයි මා අත්දුටු ඒ සුන්දර ආදරයක අතීත සටහන් පමණකි. එහෙත් ඒ සියලු මතකයන් වෙතින් මම ලැබුවේ මගේ හදවතින් මැක් හෝ නොසෙල්වී ඇත යැයි දැකිය හැකි නොසිඳෙන සෙනෙහසක ආත්මාභිමානය පිළිබඳ පණිවුඩයකි. එය සැබැවින්ම ඉතා ආකර්ෂණීය ලෙස මගේ ජීවිතය නිරතුරුවම ඉදිරියට යොමුකල, මොනයම්ම ආකාරයේ හෝ සැනසිළිදායක හෙට දවසක් වෙනුවෙන් වූ ප්‍රාර්ථනා ඒ අයුරින්ම සුරක්ෂිත කල, වටිනා ආත්මීය තිළිණයක් විය....

දිනක් හදිසියේ ම ටාන්‍යාගේ පියාගෙන් මට ඇමතුමක් ලැබිණි. ඒ සිකුරාදා දිනයකි. ඔහුට මා අත්‍යාවශ්‍යයෙන්ම මුණගැසිය යුතු බවත් පසුදින උදෑසන දහයට පර්ත් දුම්රිය ස්ථානයට පැමිණෙන ලෙසත් පැවසුවේ වැඩි විස්තරයක් නොමැතිවම ය.

මම පසුදින ෆ්‍රිමෙන්ටල් සිට දුම්රියේ ම පර්ත් ගියේ එසේ කිරීම පහසු යැයි සිතුනු බැවිනි. ටාන්‍යාගේ පියා හරියට ම දහය වන විට මා හමුවීමට පැමිණියේ ය. එදා සතියේ දිනයක් නොවන බැවින් වැඩි පිරිසක් ඒ අවට ගැවසෙනවා ද මම නොදුටුවෙමි. මම කිසිවක් ම නොවිමසා ඒ මුහුණ දෙස බැලුවේ යමක් තේරුම් ගැනීමේ බලාපො-රොත්තුවෙනි. එහි දුක්බර යමක් නොවන බව ස්ථිරව ම කිව හැකි යැයි මට සිතිනි. එය මට ප්‍රමාණවත් ය. මම වැඩි යමක් ඇසීමට ගියේ ද නැත. මගේ ප්‍රශ්නවලට ඔවුන්ගේ පිළිතුරු තේරුම් කරගැනීමට ගොස් වරක් මා අමාරුවේ වැටුනා මට මතක ය. ඒ නිස ඔහු කතා කරන යමක් වේ නම් එය තේරුම් ගැනීමට උත්සාහ ගනිමින් හිනඩව ම සිටිනවා යැයි මම සිතා සිටියෙමි. ඔහු ද විශේෂයෙන් යමක් කීමට උනන්දුවක් නොදැක්වූ අතර මට යමක් පෙන්වීමට අවශ්‍යයැයි යැයි පවසමින් පර්ත් සිට ෆ්‍රිමෙන්ටල් බලා යන දුම්රියකට මා සමඟ ගොඩ විය.

දුම්රිය පිටත්වන තුරුත් ඔහු හිනඩව මා සමඟ ඉඳගෙන සිටියේ ය. අප සිටි පෙට්ටියේ වූයේ මගීන් කිහිප දෙනකු පමණි. අප ගොඩවී සිටියේ දුම්රියේ වූ මැදිරි දෙකින් මුලින් ම තිබූ දුම්රිය මැදිරියට ය. මට ටාන්‍යාගේ මුල්ම හමුව සිහි විය. කිසිවක් කතා නොකර සිටීමේ අපහසුතාව බිඳදැමීම සඳහා මම කතාකලෙමි.

"මට ටාන්‍යාව මුලින් ම මුණගැසුනෙත් මේ වගේ ගමනක දී..."

එහෙත් ඔහු සිනාසුනා මිස කිසිවක් ම කීවේ නැත. මගේල පිළිබඳව මතකය තවමත් ඔහු තුළ ඇතැයි මට සිතිනි.

"මගේ ඒ හඳුනා ගැනීම නිසා ටාන්‍යාට මුහුණ දෙන්න සිද්ධවුන කරදර ගැන මට කණගාටුයි..."

එවර ද ඔහු ඊට පිළිතුරක් දුන්නේ නැත. දුම්රිය පිටත් විය. 'මම ඉක්මණට එන්නම්' යැයි ඔහු නැගී සිට දුම්රියේ පිටුපසට ගියේ ය. මට පුදුම සිතිනි. ලංකාවේ දුම්රියක දී නම් ඔහු වැසිකිළියට ගියා යැයි සිතීමට ඉඩ තිබිණි. මෙහි දී එසේ විය නොහැක. 'ඕනෑ කෙහෙල්මලක්' යැයි සිතා මා ඔහු එතනුරු ඔහේ සිටියෙමි. මොහොතකින් මා අසලට පැමිණි අයෙක් මා පසෙකින් හිඳ ගත්තේ ය. ටාන්‍යාගේ පියා වෙනුවෙන් ඉඩ තබා ගත සුතු වෙතැයි සිතා ඉන් ඉවත්වන්නැයි කීමට මම ඒ දෙසට හරවන්නෙමි. දෙවියනේ... මා මේ දකින්නේ

සිහිනයක් ද.....?

"ටාන්‍යා..."

මම පුදුම වුණෙමි. ඈ සිටියේ සිනාසෙමිනි.

"ඔයා කවදද ආවෙ...? මට හරි පුදුමයි..."

ඈ හැඳ සිටියේ සුදෝ සුදු ගවුමකි. ඊට උඩින් ඈ එදා හන්නාන තේවත්තේදී මගෙන් ලබාගත් කළුපාට හම් ජැකට්ටුව දමාගෙන සිටියා ය. ඒ ජැකට්ටුවේ වම් පස කොලරය අසල සුදු පාට රෝස මලක් දවටා තිබිණි. මට මේ සියල්ල තවමත් අදහාගත නොහැකි පුදුමයකි.

"ටාන්‍ය... ඇයි කතා කරන් නැත්තෙ...?"

"ලගිරු පුදුම වෙලා ඉවර ද?"

මම විශ්මිත වූවෙමි. ඈ එය ඇසුවේ සිංහලෙනි. ජානකීගේ කතාවේත් ඇගේ කතාවේත් වෙනසක් මම නොදුටුවෙමි.

"ඔයාගෙ කතාව හැමදේට ම වඩා පුදුමයක් මට..."

"මට පුළුවන් ඔයත් එක්ක සිංහලෙන් කතා කරන්න දැන් ලගිරු..."

"මට ජේනව ඒ බව..."

"මම ලංකාවට ගිය ගමනෙ එක අරමුණක් ඒක..."

"අතිත් අරමුණු මොනව ද...? ඒ අරමුණුත් සාර්ථක කර ගත්ත ද?"

"බොහොමයක් දේවල්..."

"බැරි වුණ දේවල් ගැන එහෙනම් කතා නොකර ඉඳිමු..."

"නෑ ලගිරු... ඒ බැරි වෙච්ච අරමුණු සාර්ථක කරගන්නයි මම ආපහු ආවෙ..."

"මෙහෙද ඒ අරමුණු තියල ගියේ...?"

"ඔව්..."

"ඒ මොනව ද?"

"ඒ ඔයා..."

"මම...?"

"ඔව්..." ඇය වෙත පැවතියේ කවදත් මා දැක පුරුදු ඒ සුපිරිසිදු අව්හිංසක සිනහවයි.

"මට ගම් තේරෙන්නෙ නැහැ ඔයා කියන දේ ටාන්‍යා..."

"මම තේරුම් කරල දෙන්නම්..."

"ඉතින් කියන්න..."

"කියන්න නෙමෙයි අහන්නයි තියෙන්නෙ ලගිරු..."

"මොකක් ද මගෙන් අහන්න තියෙන්නෙ ඔයාට ටාන්‍යා..."

"ඔයා ඉස්සර වගේ ම තවමත් මට ආදරේ ද ලගිරු...?"

"ඔයාට ආදරේ ද...?"

ඇය කිසිවක් ම කීවේ නැත. ඒ වෙනුවට බලාපොරොත්තු දල්වා ගත් දෑසින් යුතුව මා දෙස බලා සිටින්නට විය. මා කිසිවක් ම කියන්නට ගියේ ද නැත. කිව්ය හැකි දෙයක් මා තුව නොතිබිනි. මගේ හදවත පතුලින් මතුවී ආවේ දැඩි සංවේදී බවකි. ඒ මොහොතේ අප පසු කරමින් සිටියේ 'කැරකැවා' නැවතුමයි. ටාන්‍යා පසුපසින් වුටු ඒ සොහොන් කොත් මා සිතට ඒ මොහොතේ රැගෙන ආවේ මෙතෙක් කිසිදාක අත්විඳ නොතිබුනු ආකාරයේ සුන්දර සිහිවිල්ලකි. මගේ ආදරය මාත් සමඟ ම දිනෙක වළලා දමනු ඇත යැයි මම සිතා සිටියෙමි. අද ඒ සිහිවිල්ල යටපත් කර දමමින් මගේ ආදර ගස දළුලා වැඩෙමින් පවතින අයුරු මම දකින්නෙමි...

"ටාන්‍යා මම ඔයාට ආදරය කළ බව දැනගත්තෙ කොහොම ද ඔයා...?"

"ඒක මම හරියට ම දැනගත්ත දෙයක් නෙමෙයි ලගිරු.... මට... මගේ හිතට... දැනුන දෙයක් ඒක..."

"ඔයාට ඒ දැනුන දේ ඇත්තක්..."

"ඒ ඇත්ත නිසා නනියම... හුදකලාවේ ම දුක් කරදර ගොඩකට ඔයාට මුහුණ දෙන්න වුණා නේද ලගිරු...?"

"මට ඒ කිසිදෙයක් දුකක් වත්, කරදරයක් වත් උනේ නැහැ ටාන්‍ය..."

"මා වෙනුවෙන් ඔයා කරපු ඒ හැම කැප කිරීමකට ම පිළිතුරු හොයාගෙන තමයි මම ලංකාවට ගියේ..."

"ඒ කිව්වෙ..?"

"අවසාන තනාවටත් මගෙන් ඇත් වෙන්න ඔයාට ඕනෑ නම් ඒ ඉඩ ඔයාට ලබල දෙන්න මට මුලින් ම ඕනෑ කළා ලගිරු..."

"එහෙම හිතල නම් මගෙන් ඇත් වුණේ ඒක හරි නපුරු කමක් ටාන්‍යා..."

"ඒක ඔයාගෙ අයිතියක් ලගිරු...අනික මගේ තුවාල උනු හිතත් හොඳට ම හොඳ කරගෙන මිසක් ආයෙත් ඔයාව මුණ ගැහෙන්නෙ නැහැ කියල මම හිතා හිටියා..."

"මගේල නිසා ඔයාගෙ හිත තුවාල වෙන්න මමත් බලපෑව ටාන්‍යා..."

"එහෙම හිතන්න එපා ලගිරු... ඒක ඔයාගෙ වරදක් නිසා වුණු දෙයක් නෙමෙයි. මට උවමනා කරල තිබුණ මගේලව මුණගැහිල එයාගෙ අතට ම එයාගෙ මුද්ද බාර දෙන්න..."

"ඉතින් එයා සතුටින් ඒක බාර ගත්ත ද?"

"කිසිම සතුටකින් නෙමෙයි... ඒත් එයාගෙ දුක මට බාර ගන්න බැහැ දැන්... එයාගෙ දුක හරි සතුට හරි බාරගන්න එයාව අයිති කරගත්ත කෙනෙක් එයාට ඉන්නව දැන්..."

"ඔයා හරියට පැහිල දැන් ටාන්‍ය..." වරින් වර සිංහලයටද ඉංග්‍රීසියටද මාරුවෙමින් ඇය කරගෙන යන කතාව මට වරෙක මහත් හාස්‍යයක් මතුකර දෙයි.

"මොකක් ද ඒ කිව්වෙ?"

"ඒ කිව්වෙ ඔයා දැන් හිතන්නෙ ලොකු ගැහැණියෙ-ක් වගේ කියලයි..." මා කිව්වේ සිනාසෙමිනි.

"මම තවම පොඩි ළමයෙක් කියල ද ඔයා හිතන් ඉන්නෙ..." මම තවත් තදින් සිනාසෙන්නට වීමි.

"ඔය හැමදේකට ම වඩා ඔයා වෙනුවෙන් ඔයාගෙ භාෂාව ඉගෙන ගන්න මට ඕනැකමක් තිබුණ... ඔයාගෙ ආදරය වෙනුවෙන් මම ඔයාට පිළිගන්වන ගෞරවය ඒකයි ලගිරු..."

ඈ කතා කළේ හැඟීම් බරව ය.

"ඔයා මම වෙනුවෙන් ඔය තරම් දෙයක් ගැන හිතුවෙ ඇයි ටාන්‍යා..."

"මමත් ඔයාට ආදරය කරන නිසා ලගිරු..."

"ඔයත් මට ආදරය කරනව.. කවද ඉඳල ද ඒ...?"

"හැමදාම... හැමදාම මම ඔයාට ආදරය කළා ලගිරු.... මගේ හදවතේ ගැඹුරු පත්ලක මුතුකැටයක් වගේ ඒ ආදරේ සැඟවිලා තිබුණ. මගේල මට ලංවුණාහම මම හිතුව ඒ ආදරේ මුතුකැටය අයිති එයාටයි කියල. හමුත් ඒ ආදරය තවතවත් හදවත පත්ලට ම කිදාබැස්ස මිසක් ඒක මතුපිටට අරගෙන එන්න මගේලට හැකියාවක් තිබුණෙ නැහැ... ඒ ආදරයත් එක්ක මේ ලෝකෙ හැමදාම මම හුදකලා වෙනවයි කියල හිතපු යුගයක තමයි ඔයා ආපහු පර්ත් ආවෙ..."

"දැන් ඔය අතීත කතා අපි නවත්තමු..."

"ඔව්... ආයෙ කවදාවත් මතුකර නොගන්න..."

"ඔයා මොනවද මගෙන් සාර්ථක කරගන්නවයි කියල හිතාගෙන ආව අරමුණු ටාන්‍යා..."

ආදරයෙන් පිරුණු දෑසින් යුතුව ඈ මොහොතක් මා දෙස බලා සිටින්නට විය. ඇගේ කැමැත්තට අනුව ඒ දෑස මත මම ආදරයේ සටහන් ප්‍රථම වරට කියවූවෙමි... මගෙන් දෑස ඉවතට ගත් ඇය, ඇඳ සිටි ජැකට්ටුවට අත යවා යමක් සොයන්නට විය. මට ඒ නිමේශය අත්හරයාමට සිත් වූයේ නැත.

"පොඩ්ඩක් ඉන්න ටාන්‍ය..."

මම සාක්කුව තුළ තිබූ ඇගේ අත මත මගේ අත්ල තබා ඇගේ උත්සාහය වැලැක්වූවෙමි. එය මා අපහසුවට පත් කළේ නැත. ඒ සඳහා මට අයිතියක් දැන් ඇත යයි සිත කියයි. නමුත් මගේ අත එලෙස දිගට ම තිබීම අපහසුවක් ය යන හැඟීම මතුව එමින් තිබිණි. මම හිනඩව ම අත ඉවතට ගැනීමට සැරසුනෙමි. එහෙත් ටාන්‍යා ඊට ඉඩ දුන්නේ නැත. සාක්කුවෙන් ඉවතට ගත් සුරතේ ඇඟිලි තුඩුවලින් ඈ මගේ අත අල්ලාගත්තාය.

"ඇයි ලගිරු මාව නැවැත්තුවෙ...?"

මම සිනාසෙමින් ඇය දෙස බැලුවෙමි. නමුත් මට වචන අමතක වී තිබිණි. ඇගේ ඇඟිලි තුඩු වෙතින් ලැබුණු මුදු පහස මා හදවතේ නැග එමින් තිබූ වචන ද සිහිවිලි ද අඩපණ කොට දමා තිබිණි. මම ඒ සිහිඳු අතැඟිලි දෙස බැලුවෙමි.

"ටාන්‍යගේ තියපොතු හැමදාම ඇයි එකම පාටකින් තියෙන්නෙ..."

අවස්ථාවට කිසිසේත් ම උචිත නොවන සිහිවිල්ලක් වචන වලට හැරවුණු බව ඒ මොහොතේ ම මම වටහා ගතිමි.

"ඒහිසාද ලගිරු ඒ දවස්වල මට ඒ තරම් කැමැත්තක් පෙන්නුවෙ නැත්තෙ..."

මම ලැජ්ජාවට පත් වුණෙමි. එහි එක්තරා ඇත්තක් ඇත.

"නෑ... ඒක මට කිසිම ප්‍රශ්නයක් උනේ නැහැ ටාන්‍යා..." මා කියුවේ මුළුමහිත්ම ඇත්තක් නොවුවද එය බොරුවක්ද නොවේ යැයි මට සිතිනි. සම්පූර්ණ ඇත්ත නම් මට ඇය කෙරෙහි කිසිම කැමැත්තක් දුටු පමණින් ඇති නොවුන බවයි. එය මට මා ගැනම අද සිනාසීමට තරම් හේතුවක් වුවද ඒ ඇත්ත පිළිගැනීමට මම පසුබට නොවෙමි. සමහර විට කාලයාගේ ඇවෑමෙන් ඈ වෙනුවෙන් මගේ හදවතේ පැලපදියම් වූ ඒ ආදරයේ හැඟීම් දිනෙන් දිනම වඩ වඩාත් ශක්තිමත් වූයේ ද ඒ නිසාම විය හැකිය.

"ඒක නෙමෙයි ලගිරු... කියන්න මොකක් ද මගෙන් අහන්න හැදුවෙ කියල..."

""මට දැන් මතක නැහැ...

"එහෙනම් මම සාක්කුවෙන් එළියට ගන්න ද මේක...?"

"ආ.. මට මතකයි දැන්... ඇසි ඔයා මේ ජැකට් එක තියාගත්තෙ... ඒ අවස්ථාවෙන් පස්සෙ ඒකෙ වැදගත්කමක් ඔයාට නියනවයි කියල මම හිතුවෙ

මෙතෙක් කතාව

උසස් අධ්‍යාපනය සඳහා පර්ත් පැමිණෙන ලගිරුට එහිදී ටාන්‍යා මුණගැසෙයි. ඕස්ට්‍රේලියානු සංස්කෘතිය තුල හැඳී වැඩී තිබුනද ටාන්‍යා වෙතින් දිස්වෙන නිගතමානී අභිලාෂක ගති පැවතුම් වෙතට සිත ඇදී යන ලගිරු, ජීවිතයේ මෙතෙක් අත්විඳ නොතිබූ සංවේදීත්වයක් ඇය නිසා සිය හදවත ගිම් කරගෙන සිටින බව කල්යාමේදී තේරුම් ගනියි. ටාන්‍යාගේ ආදරය තමාගේම මිතුරරකු වන මගේලට ඉතිමිමත් සමඟ මව්බිම කරා යන ලගිරු, හදවතේ තුම විසිහිම මිහිදන් කරවනු ලැබූ රහස්‍ය ආදරයක මතක සටහන් සමඟ හුදකලා දිවියකට මුලපිරයි. තවත් වසර කිහිපයකට පසු මගේල වෙනත් කෙනෙකු සමඟ ඉදිසිරුම විවාහවීම නිසා නොසන්සුන් වන ඔහු නැවත වරක් පර්ත් පැමිණෙන්නේ ටාන්‍යා වෙනුවෙන් වූ ප්‍රාර්ථනා ගොන්නක් තොදි බැඳගෙනය. එහිදී ලගිරු අනතුරුබව මුහුණපෑවිද එ ගේතුවෙන්ම ටාන්‍යා නැවත මුණගැසීමේ අවස්ථාව ඔහු හිමිකරගනී.